# පාලි අට්ඨකථාකරණයේ ඉතිහාසය

අර්ථය කියනුයේ අර්ථය වර්ණනා කරනුයේ අට්ඨකථා වශයෙන් අත්ථ යන වචනය හා කථා යන වචනය විග්‍රහ කොට තිබේ. සංස්කෘත අර්ථ යන්නෙන් අත්ත ශබ්දය ද ඉන් අට්ඨ යන්න ද සෑදී ඇති බව එක් මතයකි. නමුත් පාලියේ හා ප්‍රාකෘතයේ අට්ඨ යන පදය පැහැදිලිවම දැකිය හැකිය. එමනිසා එය අර්ථ ශබ්දයෙන් ප්‍රභවය ලද්දක් නොවේ. අත්ථ ශබ්දය ත්‍රිපිටකයේ මුල්කාලීන සූත්‍රවල පැහැදිලිවම අට්ඨකථා යන අර්ථයේ යෙදී ඇති බව විචාරක මතයකි. උදාහරණ වශයෙන් ඔවුන් විසින් පෙන්වා දෙනු ලබන්නේ

- ❖ අත්ථූපසංහිතො - විනය පිටකයේ භික්ෂු වග්ගය
- ❖ අත්ථ විසඳ්ඣාපනියා } සෝණදණ්ඩ සූත්‍රය - දීඝ නිකාය
  වංකී සූත්‍රය - මජ්ඣිම නිකාය
- ❖ අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය - අංගුත්තර නිකාය

යනාදි සාධකයෝය. සමන්ත පාසාදිකා, සුමංගල විලාසිනී හා මනොරථපූරණී යන අටුවාවන් ද මෙකී අත්ථ ශබ්දය අට්ඨකථා යන අර්ථයේම යෙදී ඇති බව විස්තර කොට තිබේ. එහෙත් මෙම ත්‍රිපිටකාගත ශබ්දය අර්ථය තේරුම වැනි අදහසක් දුන්න ද ඉන් අට්ඨකථා යන පළල් අර්ථයක් ගම්‍ය නොවේ. උදාහරණ වශයෙන් අභිධම්ම යන පදය ඉදිරිපත් කළ හැකිය. එම වචනයෙන් අද අප අදහස් කරන අභිධර්මය එදා නියෝජනය වූයේ නැති බව පිළිගත හැකි කරුණකි. අභිධම්ම යන පදය එකල බෝධිපාක්ෂික ධර්මාදී වෙනත් අර්ථාදියට භාවිත වූ බව විචාරක මතයකි. අත්ථ යන පදය ත්‍රිපිටකය හා නෑකම් කියනුයේ අත්ථ යන වචනය නිසා නොව ත්‍රිපිටකයේ එන විභංග නිද්දෙස යන වචන සමග බව පැවසිය හැකිය. මෙම විභංග නිද්දෙස යනු පැහැදිලිවම ත්‍රිපිටකයේ ආ අටුවාවන් බව පෙන්වා දිය හැකිය. අටුවා කරණයේ ආරම්භකයා බුදු හිමියන්මය. උදාහරණ වශයෙන් මජ්ඣිම නිකායේ භද්දෙක රත්ත සූත්‍ර දැක්විය හැකිය.

උද්දෙසඤ්ච විභංගඤ්ච දෙසිස්සාමි
උද්දෙසය - අතීතං නාන්වාගමෙය්‍ය
විභංගය - කථමඤ්ච භික්ඛවෙ අතීතං අන්වාගමෙති

මජ්ඣිම නිකායේ විභංග වග්ගය ද උද්දේස විභංග සූත්‍රය ද තවත් සාධකයෝය. විනය උභතෝ විභංග යනු ප්‍රාතිමෝක්ෂයට කළ පැහැදිලි අටුවාවයි. උදාහරණ

- ❖ සුත්ත = යො පන භික්ඛු භික්ඛූනං
- ❖ විභංග = යො පනාති යො යාදිසො

යනාදිය දැක්විය හැකිය. මේ අනුව මුල් කාලීන සූත්‍ර විනය තුළ අට්ඨකථා යන අර්ථයේ භාවිත වී තිබෙන්නේ විභංග යන වචනය බව මැනවින් ස්ඵුට වේ. බුදුහිමි විභජ්ජවාදියෙකු ලෙස හැඳින්වීමට පෙළඹුණේ මෙම විභංග හෙවත් බෙදා විග්‍රහ කිරීමේ ලක්ෂණය නිසා විය හැකිය.

අට්ඨකථා යන වචනය මුලින්ම අටුවා යන අර්ථයේ යෙදී තිබෙන්නේ අභිධර්මයේ ධම්මසංඝනිප්පකරණයේ ය. එහි මාතිකා කාණ්ඩයට කළ විභංගය හෙවත් අටුවාව අට්ඨකථා කාණ්ඩයකි. අභිධර්මයේ ග්‍රන්ථවල සැකැස්ම සාමාන්‍යයෙන් දෙවන හා තුන්වන සංගායනා අතර කාලයට අයත් බැවින් අට්ඨකථා යන වචනය මුලින්ම එම අර්ථයේ භාවිත වූයේ මෙම කාල පරිච්ජේදය තුළ විය හැකිය.

එසේම අට්ඨකථා යන අර්ථයේ යෙදුණු තවත් සමකාලීන පදයක් වශයෙන් පෙන්වා දිය හැක්කේ 'නිද්දෙස' යන්නයි. එනම් සුත්ත නිපාතයේ අට්ඨක වර්ගයට කළ අටුවාව මහානිද්දෙසය වන අතර සුත්න නිපාතයේ පාරායන සූත්‍ර හා ඛග්ගවිසාන සූත්‍රය සඳහා කළ අටුවාව චූල නිද්දෙසයයි. මෙම නිද්දේසවල කාලය තෙවන සංගායනාවටත් පෙර විය යුතු බව සමහර විචාරකයෝ කල්පනා කළත් සාමාන්‍ය අදහස නම් ඒවා තුන්වෙනි සංගායනාවට හා බුද්ධඝෝෂ කාලය අතර විය යුතු බවය. මේ අනුව අට්ඨකථාකරණයේ ඉතිහාසය

1. විභංග
2. අට්ඨකථා
3. නිද්දෙස

යන පද ඔස්සේ විකාශනය වී ඇති බව පෙන්වා දිය හැකිය. ඉහත සඳහන් කළ අටුවා ලක්ෂණ දරන සූත්‍ර හා නිද්දෙස ග්‍රන්ථ හැරුණු විට තවත් වැදගත් වන ප්‍රධාන අටුවා වර්ග දෙකකි. එනම්

i. පාලි මුත්තක අටුවා හා
ii. පාලි අට්ඨකථා

පාලි මුත්තක අටුවා වශයෙන් හෙළ අටුවාවන් හා සෙසු පාලියෙන් සිංහලට පරිවර්තනය කරන ලද අටුවා අදහස් කෙරේ. හෙළටුවා මහත් රාශියක් තිබුණ අතර ඒවා මිහිඳු හිමියන් හා සිංහල භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කරන ලදැයි ද ඊට පදනම් වූයේ මගධ බසින් තිබුණු අටුවා බව ද දඹදිවින් එම අටුවා මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙනෙන ලද බව ද සාම්ප්‍රදායික ග්‍රන්ථවල පැහැදිලි කොට තිබේ. ඒවා බුද්ධකාලීන බව සාම්ප්‍රදායේ පිළිගැනීමයි.

"මගධ බසින් වැටෙමින්ආ බුදු කැලි අටුවා
හෙළදිව් ඇජරො හෙළබසින් තැබූහ"

ප්‍රධාන හෙළටුවා තුනක් බව සමන්ත පාසාදිකා විනය අටුවාවේ මෙසේ සඳහන් වේ.

“මහා අට්ඨකථාසඳච මහාපච්චරිමෙවච
කුරින්දිසඳාචාපි තිසෙසාපි සීහලට්ඨ කථා ඉමා”

මහා අටුවාව සමස්ත ත්‍රිපිටකයටම කරන ලද්දකි. මෙය මිහිදු හිමියන් විසින් ගෙනා අටුවාව බව පිළිගැනේ. පාලි භාෂාවෙන් හෝ අශෝක ශිලා ලේඛන භාෂාවෙන් ලියැ වී ඇතැයි සැළකේ. මහා පච්චරිය හා කුරුන්දිය විනය සඳහා ලියැවී ඇත. ඒ බව සමන්ත පාසාදිකාවේ මහා පච්චරිය 95 වාරයක් ද කුරුන්දිය 67 වාරයක් ද සඳහන් වීමෙන් මනාව ස්ඵුට වේ. මෙම අටුවා දෙකම ලංකාවේ දී රචිත බව පිළිගැනේ. අන්ධක අටුවාව ආන්ධ්‍ර දේශයෙන් ගෙනා බව සැළකේ. මෙම අටුවාව හා සංඛෙපට්ඨ කථාව බොහෝ සෙයින් ප්‍රතික්ෂේපිත මත දරන නිසා මහා විහාර පාර්ශවයීය ග්‍රන්ථ නොවිය හැකිය. තවත් පාලි මුත්තක අටුවා ගණයට වැටෙන ග්‍රන්ථ සිය ගණනක් තිබෙන්නට ඇත. පුරාණ අටුවා නාමයෙන් ද හෙළටුවා හඳුන්වා ඇත.

මෙම යුග තුනේම ආ අටුවාවන්ට වඩා අංග සම්පූර්ණ වැදගත් අටුවා වශයෙන් සළකනු ලබන්නේ බුද්ධඝෝෂා දි ආචාර්යවරුන් විසින් හෙළටුවා පදනම් කරගෙන රචිත පාලි අට්ඨකථාවන්ය. සංස්කෘත භාෂාවල මෙම අට්ඨකථා ලක්ෂණ බොහෝ දැකිය හැකි වුව ද ඒවා මෙම පාලි අටුවා තරම් පරිපූර්ණ නොවේ. භාෂ්‍යවල සිද්ධාන්තයක ඓතිහාසිකත්වය විග්‍රහ නොවේ. කථාවත්ථු අටුවාවේ සිද්ධාන්ත 216ක් ගැන සර්වසම්පූර්ණ විවරණයක් අන්තර්ගත වේ. මෙම පාලි අටුවා හුදු පරිවර්තනම නොවේ. I සුත්ත II සුත්තානුලෝම III ආචාරියවාද IV අත්තනෝමති යනුවෙන් ඒවායේ විවිධ ආචාර්යවරුන්ගේ මත ද එම අටුවාචාරීන්ගේ මත ද ඉදිරිපත් කොට තිබේ. එසේම යම් වචනයක් විස්තර කිරීමේ දි i වචනාර්ථය ii නිරුක්තිය iii ව්‍යාකරණ ලක්ෂණ iv මතභේද වෙතොත් ඒවා v නිදර්ශනකථා vi අතිරේක විස්තර යනාදිය ද ඊට අන්තර්ගත වේ. ක්‍රිස්තු වර්ෂ 5 වන සියවසේ එනම් මහානාම රාජ්‍ය සමයේ දි බුද්ධඝෝෂ හිමි ත්‍රිපිටකයේ බොහෝ ග්‍රන්ථයන් ට අටුවා සම්පාදනය කර තිබේ. බුද්දක නිකායේ ග්‍රන්ථ කීපයකට සෙසු බුද්ධ දත්තාදි ඇදුරන් විසින් අටුවා සම්පාදනය කොට තිබේ.

මෙම අටුවා වර්ග හතර අතුරින් වඩාත් ම වැදගත් කොට සැළකිය හැක්කේ පෙළෙහි සූත්‍ර වශයෙන් ආ අටුවාවන්ය. ඒවා ශ්‍රී මුඛ දේශනා වශයෙන්ම පිළිගත හැකි නිසා විශ්වසනීයව ද පවති. එසේම බුද්ධඝෝෂ යුගයට පෙර පැවති සියලුම අටුවා ත්‍රිවිධ සංගායනාවට ම හසු වූ බව සුමංගල විලාසිනිය කියයි. පසුව සිංහලට පරිවර්තනය කරන ලදි.

මෙම පාලි මුත්තක අටුවා පෙළ ඇසුරින් ගොඩ නගා ගත්ත ද එහි ඇති පරස්පර විරෝධී මතාන්තර හා විවිධ ආචරියවාද බහුලව තිබුණු බව කියැවෙන පිරිසිදු ධර්මය මිශ්‍ර වී යන අයුරක් පෙනේ. එමනිසා එහි සමහර තැන් සැකයට බඳුන් වේ.

පාලි අට්ඨකථා සම්පාදනයේ දි හෙලටුවා පදනම් කර ගත්ත ද සැකයට තුඩු දුන් තැන්හි දි ප්‍රමාණ කර ගන්නේ පෙල හෙවත් ත්‍රිපිටකයයි. පෙළ අනුගමනය කළ තැන් ඉතා සාර්ථක බව පෙනේ. ඇතැම් විට විශුද්ධි මාර්ගයෙන් බලා ගත යුතු යැයි කියා සංරක්ෂණය කර තිබේ.

උදාහරණ වශයෙන් දික් සඟියේ සාමඤ්ඤඵල සූත්‍රයේ ඉන්ද්‍රිය සංවරය විස්තර කරන අටුවාව මෙසේ සඳහන් කිරීම පෙන්වා දිය හැකිය.

“සෙසපදෙසු යං වත්තබබං සියා තං
සබ්බං විසුද්ධිමගෙග විත්ථාරිතං”

සමහර තැනෙක මහා අටුවාදි මූලාශ්‍රයන්ගෙන්ම බලා ගත හැකි බව පවසා කෙටි කර ඇත.

“……. එවමාදිනි බහුනිවත්ථූති මහා අට්ඨකථං
විත්ථාරිතො වුත්තානි තත්‍රායං එකවත්ථුදිපනා”

මෙසේ අනවශ්‍ය විස්තර කපා හැර අවශ්‍ය තොරතුරු පමණක් සැපයීමෙන් අදාළ ධර්ම කාරණා විග්‍රහ කිරීම සුබාවබෝධයට හේතු වේ. එහෙත් සමහර තැනක විස්තර සැපයීමෙන් මග හැරීම නිසා එය ධර්මාවබෝධයට බාධකයක් වේ. එය පාලි අටුවාවල එන දුබලකමක් වශයෙන් ද කෙනෙකුට පෙන්වා දිය හැකිය. ආචාරියවාද හා තම මත වශයෙන් කරුණු කියන තැන ධර්මාවබෝධයේ දී සැකයට භාජනය වේ. ඇතැම් කරුණුවල සවිස්තරාත්මක ලක්ෂණ ද දැකිය හැකිය. උදාහරණ වශයෙන් මුල් බුදු සමයේ බුදුහිමි උත්තරීතර මනුෂ්‍යයෙක් වුව අටුවාවල ආශ්චර්ය අද්භූත අසමාන දෙවියෙක් වශයෙන් මූර්තිමත් කර තිබීම පෙන්වා දිය හැකිය.

මෙම පාලි අටුවාවලින් පැවසෙන්නේ ධර්මය පමණක් නොව බුද්ධකාලයේ සිට ක්‍රිස්තු වර්ෂ 1වන සියවස දක්වා ඓතිහාසික සාමාජික සාමයික හා දේශපාලනික තොරතුරු ද අන්තර්ගත වේ. එමනිසා මෙම අටුවාවන් වැදගත් වන්නේ ධර්ම ග්‍රන්ථ වශයෙන් පමණක් නොව ඓතිහාසික තොරතුරු ගවේෂණය කරන්නන්ට ද මහත් අත්වැළක් වනු නොඅනුමානය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


i. **පාලි සාහිත්‍යය** - පොල්වත්තේ බුද්ධ දත්ත නාහිමි
ii. **පාලි අට්ඨකථා** - ලබුහේන්ගොඩ චන්ද්‍රරතන හිමි
**iii. සිංහල විශ්වකෝෂයේ අට්ඨකථා ලිපිය**
iv. **ලක්දිව පාලි සාහිත්‍යය** - ජී මලලසේකර
v. **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය** - ඊ ඩබ් අදිකාරම්
vi. **බෞද්ධ සංස්කෘති විචාර සඟරාවේ ලිපිය** - කෝට්ටේගොඩ සිරිනන්ද හිමි
vii. **ධාරා සඟරාවේ අට්ඨකථා ලිපිය** - ලබුගම ලංකානන්ද හිමි
viii. **අට්ඨකථා ලිපිය** – Encyclopedia of Buddhism – vol 1 , Colombo